# බංගලා, පෞරාණික නිවාස, පෞරාණික බංගලා, සංචාරක කුලී නිවාස, සංචාරක කුලී නිවාස ඒකක ලියාපදිංචිය

**Registration of Bungalow, Heritage Home, Heritage Bungalow, Rented Homes, Rented Apartments**

**ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය**

---

## 1. බංගලා, පෞරාණික නිවාස, පෞරාණික බංගලා,සංචාරක කුලී නිවාස, සංචාරක කුලී නිවාස ඒකක හිමිකරුවන් සතු වගකීම

1. බංගලා, පෞරාණික නිවාස, පෞරාණික බංගලා,සංචාරක කුලී නිවාස, සංචාරක කුලී නිවාස ඒකකයකම හිමිකරු ශ්‍රී ලංකා සංචරණයෙහි ලියාපදිංචි විය යුතු අතර අදාළ නිර්ණායකයන්ට අනුව නිවාස පවත්වා ගෙන යා යුතුය.
2. ශ්‍රී ලංකා ශ්‍රී ලංකා සංචරණය නියම කර ඇති පරිදි ආයතනයේ හිමිකරු විසින් නිරතුරුවම අදාළ ස්ථානයන්හි පවිත්‍රතාවය, සනීපාරක්ෂාව හා ආහාරවල ගුණාත්මකභාවය පවත්වා ගෙන යා යුතුය.
3. සෞඛ්‍යයට අහිතකර තත්ත්වයන්, අයහපත් චර්යා, දුරාචාරය හෝ නියමිත ප්‍රමිතීන්ට අනුව ආයතනය පවත්වාගන යාමට අපොහොසත් වීම යන කුමන හෝ තත්වයක් පිළිබඳ වාර්ථා වුවහොත් ඒවා නිවැරදි කරගැනීමට ප්‍රමාණවත් කාලයක් හිමිකරුට ලබා දීමෙන් අනතුරුව, ඉන් ප්‍රගතියක් නොවූයේ නම්, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂක ජනරාල්වරයා විසින් නිවාස ඒකකයේ ලියාපදිංචිය අවලංගු කරනු ලැබේ.
4. අවශ්‍ය අවස්ථාවකදී පරීක්ෂා කර බැලීමට පහසුවන පිණිස සංචාරකයින් හට කාමර පහසුකම් සැපයීම පිළිබඳ විස්තර ඇතුලත් ලේඛනයක් (Guest Register) පවත්වාගන යා යුතුය. එහි ආකෘතිය දැනට හෝටල් හා ආගන්තුක නිවාසවල පවත්වාගන යනු ලබන්නාවූ ආකෘතියම විය හැක.
5. සංචාරකයන් හට නිකුත් කිරීම සඳහා මුද්‍රාව සහිත බිල් පොතක් පවත්වාගන යා යුතුය.
6. සංචාරකයන්ගේ දැනුවත් වීම පිණිස තම ලියාපදිංචි සහතිකය ප්‍රදර්ශනය කල යුතු අතර ශ්‍රී ලංකා සංචරණය විසින් නිකුත් කොට ඇති සංචාරක නිවාස ලාංඡනය ද ප්‍රදර්ශනය කල හැක.

## 2. බංගලා, පෞරාණික නිවාස, පෞරාණික බංගලා,සංචාරක කුලී නිවාස, සංචාරක කුලී නිවාස ඒකක ලෙස ලියාපදිංචිය සඳහා යෝග්‍යතාව තීරණය කරනු ලබන අත්‍යවශ්‍ය සාධක

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ බංගලා, පෞරාණික නිවාස, පෞරාණික බංගලා, සංචාරක කුලී නිවාස, සංචාරක කුලී නිවාස ඒකක ලෙස ලියාපදිංචි වීම සඳහා යෝග්‍ය වීමට පහත සඳහන් අවශ්‍යතා සපුරා තිබීම අත්‍යවශ්‍ය වේ .

1. **පිහිටීම**

අදාළ ප්‍රදේශය හා පරිසරය ආයතනයක් පවත්වා ගෙන යාමට සුදුසු විය යුතු ය.

2. **ප්‍රවේශ මාර්ගය**

ආයතනය වෙත පිවිසීමට සුදුසු ප්‍රවේශ මාර්ගයක් තිබිය යුතු ය.

3. **නිවාසය**

   අදාල බංගලා, පෞරාණික නිවාස, පෞරාණික බංගලා,සංචාරක කුලී නිවාස, සංචාරක කුලී නිවාස ඒකක පවත්වාගන යාමට සුදුසු තත්වයක තිබිය යුතුය.

4. **නිවාස අංගනය/ උද්‍යානය**

   ආයතනයට සුදුසු අයුරින් නිවාස අංගනය හෝ උද්‍යානය සකසා පවත්වා ගෙන යාම කළ යුතු ය.

5. **නඩත්තු කිරිම**

   බංගලා, පෞරාණික නිවාස, පෞරාණික බංගලා,සංචාරක කුලී නිවාස, සංචාරක කුලී නිවාස ඒකක යන අනු කාණ්ඩයන්හි ගොඩනැගිල්ල (පිටත හා ඇතුළත) ගෘහ භාණ්ඩ, උපකරණ, පිරිවෙද්දුම ආදියෙහි නඩත්තු ප්‍රමිතිය ඉහත සඳහන් ඕනෑම නිවාස ඒකකයකට සුදුසු අයුරින් පැවතිය යුතුය..

6. **රථ වාහන නවතා තැබීම**

   රථ වාහන නවතා තැබීම සඳහා ප්‍රමාණවත් ඉඩකඩක් හා මනා ආරක්ෂාවක් තිබිය යුතු ය.

**3. බංගලා, පෞරාණික නිවාස, පෞරාණික බංගලා,සංචාරක කුලී නිවාස, සංචාරක කුලී නිවාස ඒකක සඳහා මාර්ගෝපදේශන මාලාව**

1. **ආලින්දය (ඉස්තෝප්පුව) ප්‍රදේශය**

- ආලින්දය ප්‍රදේශය, පිරිසිදු, හොඳින් ඉඩකඩ ඇති, නිසි ලෙස පවත්වාගන යන ස්ථානයක් විය යුතුය.
- ආලින්දය හොඳින් වාතාශ්‍රය තිබිය යුතු අතර ප්‍රමාණවත් පරිදි ස්වභාවික හෝ කෘතීම ආලෝකයක් තිබිය යුතුය.
- ආලින්දයේ අවශ්‍ය ප්‍රමාණයට ඉඩකඩ තිබිය යුතු අතර එහි ගෘහ භාණ්ඩ හොඳ තත්වයේ ඒවා විය යුතුය.

2. **නිදන කාමර**

- කාමර එකක් හෝ ඊට වැඩිය තිබිය යුතු අතර එම කාමරවල අමුත්තන් සඳහා වෙන් වූ වැසිකිළි පහසුකම් තිබිය යුතුය.
- නිදන කාමර තුල හොඳට ඉඩකඩ තිබිය යුතු අතර ඒවා ඉතා පිරිසිදු තත්වයෙන් ද, හොඳට වාතාශ්‍රය ඇති හොඳින් පවත්වාගන යන ඒවාද විය යුතුය.
- තනි නිදන කාමරයක (Single Bed Room) ප්‍රමාණය අවම වශයෙන් වර්ග අඩි 100 කට නොඅඩු විය යුතු අතර යුගළ නිදන කාමරයක (Double Bed Room) ප්‍රමාණය වර්ග අඩි 120 කට නොඅඩු විය යුතු ය.
- පාවිච්චි කරන සෑම දොරකම හොඳ තත්වයේ අගුලු හා යතුරු, තිබිය යුතු අතර කාමරයේ දෙපසින් ම ඒවා අගුලු දැමීමට හැකිවිය යුතු ය.

- කාමරවල ජනේල තිබිය යුතු අතර ඒ සෑම ජනේලයකටම සුදුසු තිරයන් හෝ ඒවා වැසීමට හැකි ආකාරයේ ආම්පන්නවලින් යුක්ත විය යුතුය.
- කාමරයට වායුසමීකරණ පහසුකම් සපයා නැත්නම් ඒ වෙනුවට විදුලි පංකා තිබිය යුතුය. දේශගුණික තත්වයන් මත කාමර උණුසුම් කිරීමේ පහසුකම්ද තිබිය යුතුය.
- කාමර ඇතුලත අභ්‍යන්තර දුරකථන පහසුකම් හෝ අමුත්තාගේ පහසුව තකා සීනු ක්‍රමයක් තිබිය යුතුය.
- කණ්ණාඩි මේසයක් අල්මාරියක් හෝ බිත්ති අල්මාරිය හෝ ඇඳුම් එල්ලා තැබීමේ වෙනත් ආම්පන්න (Hangers) තිබිය යුතුය.
- පිරිසිදු සුවපහසු ඇඳන්වල ගුදිරි රබර් හෝ පුළුන් වලින් සැකසා තිබිය යුතු අතර පුළුන් හෝ ෆෝම් රබර් වලින් සෑදුනු කොට්ට තිබිය යුතුය. ළමයින් වෙනුවෙන් සෝෆා ඇඳන්, තට්ටු (Bunk) ඇඳන් දුනු රහිත අකුලන ඇඳන් (Futon) සැපයිය හැක. පුම්බා සකස් කරගන්නා ඇඳන් (Blow Up) අනුමත නොකෙරේ.
- තනි ඇඳක ප්‍රමාණය 1.07m x 2m කට වඩා නොඅඩු විය යුතු අතර යුගල ඇඳන් වල අවම ප්‍රමාණය 1.83m x 2m කට නොඅඩු විය යුතුය.
- අලුතෙන් පැමිණෙන සෑම අමුත්තෙකුටම පිරිසිදු නැවුම් ඇද ඇතිරිලි සැපයිය යුතු අතර එකම අමුත්තෙක් සඳහා ඒවා අඩු තරමින් දින තුනකට වරක්වත් මාරු කල යුතුය.
- සෑම නිදන කාමරයකටම යාව වර්ග අඩි 30 කට නොඅඩු බිම් ප්‍රදේශයක් සහිත නාන කාමර, වතුර මලක් හා වැසිකිලි තිබිය යුතු අතර ඒවායේ ප්‍රමාණවත් සනීපාරක්ෂාවක් සහ මනා පැවැත්මක් තිබිය යුතුය.
- නාන කාමර පරිසිදු මෙන් නොලිස්සන ජලය උරා නොගන්නා ද්‍රව්‍ය වලින් සැකසී තිබිය යුතුය.
- නාන කාමර බිත්ති වලට අඩි 5ක් උසට ටයිල් අල්ලා තිබීම හෝ මෘදු සිමින්ති නිමාවක් හෝ සේදිය හැකි රබර් මිශ්‍ර තීන්ත ගැලවූ බිත්ති වලින් යුක්ත විය යුතුය.
- නාන කාමරය තුල මුහුණ සෝදන බේසමක් (Wash Basin) කණ්ණාඩියක් (Mirror) තුවා දැමීමට රාක්කයක් සහ ඇඳුම් එල්ලන කොකු ආදිය තිබිය යුතුය.
- වතුර හොඳින් උර ගන්නා හොද තත්වයේ තුවා තිබිය යුතු අතර ඒවා නිරතුරුවම මාරු කල යුතුය.
- අවශ්‍යතාව පරිදි ඇඳුම් මැදීමේ බෝඩ් (Ironing Board) ඉස්තිරික්ක සැපයිය හැකි විය යුතුය.
- විදුලි සැපයුම සහිත නිවෙස්හි සෑම කාමරයක් තුලම විදුලි පේනු තුඩු (Plug Points) තිබිය යුතුය.

3. **කෑම කාමරය**

- කෑම කාමර හොඳින් පවත්වාගන යා යුතු අතර එය ඉතා පිරිසිදු විය යුතුය. මෙහි තිබුය යුත්තේ හොද තත්වයේ සුව පහසු මේස පුටුය.
- එහි හොද තත්වයේ හැඳී ගෑරුප්පු, පිහි, පිගන් කෝප්ප හා මේස රෙදි අවශ්‍ය ප්‍රමාණයට තිබිය යුතුය.

4. **මුළුතැන්ගෙය**

- හොඳින් ඉඩකඩ ඇති පිරිසිදු හොඳින් වාතාශ්‍රය ලැබෙන ස්ථානයක් විය යුතුය.
- මුළුතැන්ගෙයි පොලොව ජලය උර නොගන්නා පහසුවෙන් පිරිසිදු කල හැකි ද්‍රව්‍ය වලින් නිමකොට පැවතිය යුතුය.
- මුළුතැන්ගේ ප්‍රදේශය සියලුම වර්ගයේ කෘමින්ගෙන් හා මියන් ආදීන්ගෙන් තොර විය යුතුය. මුළුතැන්ගෙය තුල ඇති සියලු විවෘත කොටස් මැස්සන් ඇතුල්වීම වලක්වන දැල්වලින් ආවරණය කර තිබිය යුතුය.
- සිල්ලර බඩු සහ ඉක්මනින් නරක්විය හැකි භාණ්ඩ තබන කුඩා සිදුරු ඇති දැල් ගැසූ දොරවල් තිබිය යුතුය.
- අවශ්‍ය පමණ ශීතකරණ පහසුකම් තිබිය යුතුය. මාළු, මස්, කිරි ආහාර, පිසූ හා නොපිසූ ආහාර ඒවා මිශ්‍ර වීමෙන් නරක්වීම වැලැක්වීම සඳහා වෙන වෙනම තැන්පත් කල යුතුය.
- මුලුතැන්ගෙය තුල ඇතිවිය හැකි ගිනි ගැනීම් සඳහා පූර්වෝපක්‍රම සලසා තිබිය යුතුය.
- මුළුතැන්ගේ තුල පිගන් හා වීදුරු භාණ්ඩ ආදිය පිරිසිදුව සෝදා ගැනීම සඳහා වතුර ගලායන සින්ක් එකක් (Sink) තිබිය යුතු අතර උණු ජලයෙන් සේදීමේ පහසුකම් ද තිබිය යුතුය.

5. **පොදු කරුණු**

- අමුත්තන්ගේ පැමිණීමේ ලේඛනයක් පවත්වා ගත යුතු වේ. එහි ඔවුන්ගේ නම, ලිපිනය, ගමන් බලපත්‍ර අංකය/ ජාතික හැඳුනුම්පත් අංකය/ පැමිණීමේ, පිටත්වීමේ දිනය, ආදිය සටහන් විය යුත්තේ අනාගත පිරික්සුම් අවශ්‍යතා වෙනුවෙනි.
- සෑම ගනුදෙනුවකටම වලංගු ලදුපත් නිකුත් කල යුතු අතර නිසියාකාරව වාර්තා තැබිය යුතුය.
- ආහාර සපයනු ලබන්නේ නම්, කෑම වර්ග හා ඒවායේ මිල දර්ශකයක් තිබිය යුතුය.
- හොඳ තත්වයේ ඇද ඇතිරිලි තුවා හැඳි ගෑරුප්පු පිහි පිගන් බඩු සහ විදුරු බඩු ප්‍රමාණවත් තරම් තිබිය යුතුය.
- ප්‍රථමාධාර පහසුකම් තිබිය යුතුය.
- ආරක්ෂාව සඳහා පඩිපෙළවල් විදුලි සෝපාන අඩිය හොඳින් ආලෝකමත් කර තබා ගත යුතුය.
- මුහුදු වෙරල ආශ්‍රිත ප්‍රදේශවල හා පිහිනුම් තටාක ඇති ඒකකවල අමුත්තන්ගේ ආරක්ෂාව සඳහා ප්‍රමාණවත් පියවර ගෙන තිබිය යුතුය.
- අමුත්තන්ගේ ඇඳුම් ආදිය සෝදා ගැනීමට අවශ්‍ය Laundry පහසුකම් සපයා දිය යුතුය.
- මුළුතැන්ගෙය තුල හා අවට ඇති ජලප්‍රවාහන පද්ධතිය පිරිසිදුව හා ආවරණය කොට එම ජලය භූගත වලකට (Pit) ගලා යාමට සැලැස්විය යුතුය.
- කසල ඉවත් කරන තෙක් ආවරණය කරන ලද බාල්දි වල තැබිය යුතුය.

- වාහන නැවත්වීම සඳහා සෑහෙන ඉඩ පහසුකම් තිබිය යුතුය.
- අමුත්තන්ට ගමන් යාමට, ඔවුන් වෙනත් තැන්වලට මාරු කිරීමට කුලී රථ පහසුකම් තිබිය යුතුය.
- අසනීප තත්වයකදී වෛද්‍ය නිලධාරිවරයෙකුගේ සේවය ලබා ගැනීමට කටයුතු සලසා තිබිය යුතුය.
- අබාධිත පුද්ගලයින් සඳහා අවශ්‍ය පහසුකම් සලසා තිබීම වඩාත් සුදුසුය

* නිල් පැහැයෙන් මුද්‍රිතව ඇති අවශ්‍යතා අනිවාර්ය වේ.